(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 379.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2014 ජූලි මස 24 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2585/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) රජයේ සංඛ්‍යා ලේඛනවලට අනුව ශ්‍රී ලංකාවේ එක් පවුලකට මාසයක් ජීවත්වීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එක් පවුලකට එක් මාසයකදී ආහාර සඳහා සහ ආහාර නොවන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් පවුලකට ජීවත්වීම සඳහා මාසිකව අවශ්‍ය මුදල එක් එක් දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සාමාජිකයින් තුන් දෙනෙකු සහිත පවුලකට මාසයක් ජීවත්වීම සඳහා රු.7500.00 ක මුදලක් ප්‍රමාණවත් වන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3250/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3834/'13

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 2013.03.19 දින වන විට සිටි සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්, වැටුප් හා වෙනත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කර ඇති ඇතැම් අය විවිධ චෝදනාවලට ලක් වී ඇති පුද්ගලයින් බවත්;

(ii) ඇතැම් අධ්‍යක්ෂවරුන්ට එරෙහිව කම්කරු කොමසාරිස් කාර්යාලයේ නඩු විභාගවෙමින් පවතින බවත්;

(iii) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සේවය සඳහා දූෂණ චෝදනා ලැබ සිටි නිලධාරීන් පිරිසක් බඳවා ගෙන සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) හි සඳහන් තත්ත්වයන් නිසා මුළු මහත් රක්ෂණ සංස්ථාවම අපකීර්තියට සහ අගාධයට වැටෙමින් පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය වැළැක්වීම සඳහා විවිධ චෝදනා ලබා ඇති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හා දූෂිත නිලධාරීන් එම සංස්ථාවේ සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4150/'13

4.

ගරු අනුර දිසානායක මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කතරගම, තම්මැන්නාව ප්‍රදේශයේ මැණික් ඉඩම් වෙන්දේසියක් සිදුකරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම වෙන්දේසිය තුළින් උපයා ගන්නා ලද මුළු ආදායම කොපමණද;

(iii) එම මුදල් නියමිත ක්‍රියාපටිපාටියට අනුව ලබා ගත්තේද;

(iv) ඉහත වෙන්දේසියට අදාළව තවදුරටත් අයවිය යුතු මුදල් තිබේද;

(v) එම ඉඩම් වෙන්දේසියේදී ආහාර හා තේ වෙනුවෙන් දරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4176/'13

5\.
ගරු රෝසි සේනානායක මහත්මිය,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පාලනය වන කොළොන්නාව ප්‍රධාන සේවා ස්ථාන උපකරණ වැඩපොළෙහි අධීක්ෂණ කටයුතු සිදුවන්නේ කුමන නිලධාරියෙකු යටතේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂයේ ජුනි මාසය දක්වා කාල සීමාව තුළ ඉහත වැඩපොළෙහි,

(i) පොම්ප මිලදී ගැනීමට, අමතර කොටස් මිලදී ගැනීමට සහ ඉන්ධනහල් අලුත්වැඩියාවට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අමතර කොටස් විකිණීම තුළින් උපයන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2013 වර්ෂයේ ජුනි මාසය අවසන් වන විට එම වැඩපොළෙහි සේවයේ නියුතුව සිටි සේවකයින් සංඛ්‍යාව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4630/'13

6\.
ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී සහල් මෙට්‍රික් ටොන් ලක්ෂ දෙකක් අපනයනය කිරීම සඳහා 2012 අයවැයෙන් රුපියල් මිලියන 200 ක් වෙන් කළ බවත්;

(ii) ඒ වෙනුවෙන් දකුණ, නැගෙනහිර, උතුරු මැද හා උතුර යන පළාත්වල සහල් අපනයන කලාප 4ක් පිහිටුවීමට යෝජනා කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සහල් අපනයන කලාප ආශ්‍රිතව රජය විසින් සහ පුද්ගලික අංශය විසින් ඉදිකර ඇති වී මෝල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් බදු සහන යටතේ ඉදිකර ඇති වී මෝල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් සහල් අපනයන කලාපවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ඒ සඳහා තෝරා ගත් ගම්මාන එක් එක් කලාපය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ වන විට එම එක් එක් කලාපයෙන් අපනයනය සඳහා ලැබෙන සහල් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (ආ)(i) හි සඳහන් එම වී මෝල් පිහිටි ස්ථානවල නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4712/'14

7.
ගරු මොහමඩ් අස්ලම් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුරුන්කන් පොලිස් වසමට අයත්, මලුවරායර්, කට්ටෙයි අඩම්පන්, මඩුපාර, මුරුක්කන් ලිපිනයේ පදිංචිව සිටි මාරිමුත්තු ෂන්මුගම් මහත්මිය සහ ඇයගේ පවුලේ සාමාජිකයන් එල්.ටී.ටී.ඊ. තර්ජන හමුවේ එම නිවස හැර ගොස් සරණාගතයින් ලෙස වෙනත් ප්‍රදේශයක ජීවත් වූ කාල සීමාව තුළ දී ඔවුන්ගේ නිවස පිහිටි ස්ථානයේ අධි බලැති විදුලි රැහැන් යෙදීම සඳහා වූ මහා පරිමාණයේ විදුලි කුළුණක් ඉදිකරනු ලැබ ඇති බවත්;

(ii) ඔවුන්ගේ නිවස ඉවත් කොට එම ස්ථානයේ විදුලි කුළුණක් ඉදිකිරීම වෙනුවෙන් මාරිමුත්තු ෂන්මුගම් මහත්මියට වන්දි මුදල් ලබා දීම නිර්දේශ කරමින්, ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් අංක DGM (P&HM-R1) GEN හා 2011.07.07 දිනැති ලිපිය මගින් වව්නියාවේ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරු වෙත ලිඛිතව දැනුම් දී ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) පදිංචි නිවස අහිමි වී අසරණභාවයට පත්ව සිටින ෂන්මුගම් මහත්මියට ලබාදිය යුතු වන්දි මුදල් මෙතෙක් ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම වන්දි මුදල් නොපමාව ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4743/'14

8.
ගරු අශෝක් අබේසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලයට මහා භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලය විසින් වාණිජ බැංකුවලින් ණය මුදල් ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) ලාබ හෝ පාඩු නොමැති මට්ටමින් ලංකා විදුලිබල මණ්ඩලය පවත්වාගෙන යාම සඳහා ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4811/'14

9.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උඩප්පුව, සෙල්වපුරම් ගම්මානයේ මාර්ගය විටින් විට අබලන්ව පස් කන්දක තත්ත්වයට පත් වන බවත්;

(ii) පාසල් සිසුන් හා රෝගීන් එම මාර්ගය ඔස්සේ ගමන් කිරීමේදී නොයෙක් දුෂ්කරතාවලට මුහුණ පාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත තත්ත්වය සලකා බලා එකී මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4849/’14

10.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සෑම අවුරුදු තුනකට - හතරකට වරක් ගෘහ ඒකක (කුටුම්භ) ආදායම් හා වියදම් සමීක්ෂණය නම් වූ වාර්තාවක් පළකරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත කී වාර්තාවට අනුව,

(i) 2006/07, 2009 සහ 2012/13 යන වර්ෂ සඳහා ජාතික මට්ටමින් මාසික මධ්‍යයන (නාමික) ගෘහ ඒකක ආදායම කවරේද;

(ii) නියමිත පාදක වර්ෂය මත 2006/07, 2009/10 සහ 2012/13 යන වර්ෂ සඳහා ජාතික මට්ටමින් මාසික මධ්‍යයන (මූර්ත) ගෘහ ඒකක ආදායම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4904/’14

11.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේදී වැලිසර, ශ්‍රී ලංකා නාවික හමුදා රෝහලට ජපානයේ නිෂ්පාදිත විකිරණ යන්ත්‍රයක් මිලදී ගනු ලැබුවේද;

(ii) එසේ නම්, එය මිලදී ගත් දිනය කවරේද;

(iii) ඊට වැය කළ මුදල කොපමණද;

(iv) එය ගෙන්වන ලද සමාගමේ නම කවරේද;

(v) එම යන්ත්‍රය නාවික හමුදා රෝහලට භාර ගැනීමට පෙර තත්ත්ව පරීක්ෂාවකට භාජනය කර අනුමතිය ගෙන තිබුණේද;

(vi) එසේ නම්, එම අනුමතිය ලබාදුන් අයගේ නම් හා තනතුරු කවරේද;

(vii) විකිරණ යන්ත්‍රය සහ එහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව අදාළ සමාගම සමඟ වගකීමකට බැඳී තිබුණේද;

(viii) එසේ නම්, එම වගකීම් කාල සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට ඉහත සඳහන් යන්ත්‍රය ක්‍රියාකාරී තත්ත්වයෙන් පවතින්නේද;

(ii) නොඑසේ නම්, එය අක්‍රිය වූ දිනය කවරේද;

(iii) එම යන්ත්‍රය වගකීම් කාල සීමාව තුළදී අක්‍රිය වී ඇත්නම්, අදාළ සමාගම මගින් එය නොමිලේ අලුත්වැඩියා කර ගැනීමට හැකියාව තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) එම යන්ත්‍රය මිලදී ගැනීමේදී යම් අක්‍රමිකතාවයක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4949/'14

12.

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත්, කොලොන්නාව තෙල් නිමාවෙන් (CPSTL) 2/3ක කොටසක් ඉන්දියන් තෙල් සමාගමට ලබාදී තිබේද;

(ii) කොලොන්නාවේ පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අවටින් පවරා ගත් අක්කර 80ක ඉඩම ඉන්දියන් තෙල් සමාගමට නොමිලේ ලබාදීමට සාකච්ඡා පවත්වනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2672/'12

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දුම්රිය හරස් ගේට්ටු නොමැති අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල වර්ෂ 2010 සිට 2012 දක්වා කාල සීමාව තුළ,

(i) සිදුවී ඇති දුම්රිය අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) සිදුවූ එම අනතුරු නිසා මරණයට පත්වූ සංඛ්‍යාව කොපමණද;

(iii) තුවාල ලැබූ සංඛ්‍යාව කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග නිසා සිදුවන අනතුරු හේතුවෙන් හානි සිදුවන්නන්ට විශේෂ වන්දි ක්‍රමයක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, එම වන්දි ක්‍රමය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3251/'12

14.

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3835/'13

15.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හබරාදුව, ලනුමෝදර පදිංචි ඒ. පියල් හේමන්ත මහතා 1991.01.15 වැනි දින පොලිස් සේවයට බැඳී දිවයිනේ විවිධ ප්‍රදේශවල සේවය කර ඇති නිලධාරියෙකු බවත්;

(ii) 2010 වර්ෂයේ සිට කැලණිය කොට්ඨාසයේ, පෑලියගොඩ පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කළ බවත්;

(iii) ඔහු තම සේවා කාලය තුළදී පෙන්වන ලද විවිධ දක්ෂතා වෙනුවෙන් මූල්‍ය ත්‍යාගයන් පවා ලැබූ නිලධාරියෙකු බවත්;

(iv) 2011.04.13 වැනි දින රාජකාරී විවේකයෙන් පසු නිවසට පැමිණි අවස්ථාවේ දී සර්පයෙකු දෂ්ට කිරීම හේතුකොටගෙන මාස කිහිපයක් සිහිමුර්ජා තත්ත්වයෙන් පසුවීම නිසා හේමන්ත මහතාට සේවයට වාර්තා කිරීමට හෝ තම අසනීප තත්ත්වය පිළිබඳව සේවා ස්ථානයට දැනුම්දීමට හෝ නොහැකි වී ඇති බවත්;

(v) මෙම තත්ත්වය යටතේ 2011.05.14 වැනි දින සිට ඔහු තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නියෝගයක් නිකුත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හේමන්ත මහතා පොලිස් සේවයේ යෙදී සිටියදී විවිධ දක්ෂතා දක්වන ලද නිලධාරියෙකු වූ බැවින් ඔහු නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 5.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කාලාවරෝධ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*11.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

12.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

16.

අසෝක සෙල්ලහේවා ශිෂ්‍යත්ව පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

17.

සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

18.

ශ්‍රී ගුණරතන ජාත්‍යන්තර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

එක්සත් මුස්ලිම් උම්මාහ් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

22.

සෙරෙට්සෙ බාමා පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**